# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2396/55 – 2024 අගෝස්තු මස 09 වැනි සිකුරාදා – 2024.08.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/83 (III)

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වන වගන්තිය යටතේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර, (පා.ම.)
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය,

2024 ජුලි මස 31 වැනි දින,
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක. 80/5,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

1A – PG 6818– 504 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියෝග

2000 ජනවාරි මස 5 වන දින අංක 1113/15 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 1999 අංක 1 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ (විකිණීමේ හා සැපයීමේ) නියෝග, පහත දැක්වෙන පරිදි වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

01. එහි 2 වන නියෝගයේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඇ) රුපියල් දෙදහසක ගාස්තුවක් සමඟ;"

02. එහි 2 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන් :-

"2අ. (1) විකිණීමේ සහතිකය නිකුත් කරන ලද දිනයේ සිට මාස දොළහකට පසුව, එම සහතිකය අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම එක් එක් ප්‍රමාද වසරක් සඳහා රුපියල් පන්දහසක ගාස්තුවක් සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(2) කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක පුහුණු වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම රුපියල් දෙසීයයක ගාස්තුවක් සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(3) කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක පුහුණු වීම සඳහා සුදුසුකම් ලබන සෑම තැනැත්තකු ම රුපියල් පන්දහසක් ගෙවනු ලැබිය යුතු ය.

(4) කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක පුහුණු සහතික පත්‍රය නිකුත් කිරීමේ දින සිට වසර තුනකට පසුව එය අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් සමඟම රුපියල් දෙදහසක් ගෙවනු ලැබිය යුතු ය".

EOG 08- 0118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.